සැ. යු. - 2014.11.28 වැනි දින පළ වූ අංක 1891 දරන ගැසට් පත්‍රයේ I : III සහ II කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,892 - 2014 දෙසැම්බර් මස 05 වැනි සිකුරාදා - 2014.12.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1046 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1049 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1053 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 දෙසැම්බර් මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 දෙසැම්බර් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1045 – B 080898—300 (2014/12)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 461

MOD/DEF/02/01/ARF/REM/601.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීමක්

**විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 ජනවාරි මස 05 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් රස්නායක මුදියන්සේලාගේ තෙන්නකෝන්, ආර්එස්පී ශ්‍රීලපාහ (නි/64634)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-77

2014 අංක 462

MOD/DEF/02/01/ARF/REM/583.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීමක්

**විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 පෙබරවාරි මස 08 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් ආතාවුද ආරච්චිලාගේ ගාමිණී පුෂ්පකුමාර සිල්වා, ආර්එස්පී ශ්‍රීලපාහ (නි/63854)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-74

2014 අංක 463

MOD/DEF/02/01/ARF/REM/585.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීමක්

**විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 ජූලි මස 21 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් සමන්ත නාමල් ජයසූරිය, ගරෙ (නි/62823)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-75

2014 අංක 464

MOD/DEF/02/01/ARF/REM/619.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීමක්

**විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 දෙසැම්බර් මස 16 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කිරි බරලාගේ නිලන්ත වජිර කුමාර, ආර්එස්පී ගැහේබ (නි/67515)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-80

2014 අංක 465

MOD/DEF/02/01/ARF/REM/617.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීමක්

**විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 දෙසැම්බර් මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් ලොකුබඩු ජයසූරිය පටබැඳිගේ චන්දන ප්‍රියන්ත ජයසූරිය, ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලංසිරෙ (නි/66477)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-79

---

2014 අංක 466

MOD/DEF/02/01/ARF/REM/620.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීමක්

**විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 පෙබරවාරි මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් ලියනගේ ගුණවර්ධන පියුමාල්, ආර්එස්පී විපාරෙ (නි/67501)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-81

---

2014 අංක 467

MOD/DEF/02/01/ARF/RET/582.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2014 අප්‍රේල් මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කර්නල් ජීවානන්ද වෛද්‍යදාස, ශ්‍රීලයුපොදුසේබ (නි/61289)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-73

---

2014 අංක 468

MOD/DEF/02/01/ARF/RET/598.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 ජූනි මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කුනන්කර දූරයලාගේ ඉන්ද්‍රකුමාර, ආර්එස්පී ගැහේබ (නි/67229)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-76

2014 අංක 469

MOD/DEF/02/01/ARF/RET/611.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 අගෝස්තු මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් උස්වත්ත ලියනසූරිය ආරච්චිගේ ප්‍රභාකුමාර චන්ද්‍රරත්න ජයවර්ධන, ගැහේබ (නි/67428)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-78

2014 අංක 470

MOD/DEF/02/01/ARF/RET/597.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 අගෝස්තු මස 17 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් පුංචි හේවගේ ඉන්දික, ශ්‍රීලංසිරෙ (නි/67377)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-72

---

2014 අංක 471

MOD/DEF/02/01/ARF/REM/621.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීමක්

**විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 දෙසැම්බර් මස 16 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

දෙවන ලුතිනන් කංකානම් පත්තිනිගේ ජනක චාමින්ද ප්‍රේමරත්න, ආර්එස්පී ගැහේබ (නි/65964)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-82

# රජයේ නිවේදන

**1941 අංක 39 දරන ණය සහන දායක ආඥාපනත අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම**

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත 1959 අංක 5 දරන ආඥාපනත 1964 අංක 24 දරන පනත 1973 අංක 41 දරන පනත, 1978 අංක 29 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥා පනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාල ණයහිමියන් වෙත ආඥා පනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. එම්. එස්. එන්. කේ. විජේතුංග,
ලේකම් (වැ.බ.),
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2014 ඔක්තෝබර් මස 19 වැනි දින,
අංක 80,
අධිකරණ මාවත,
කොළඹ 12,

උපලේඛනය

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (1) 43356 | මහවිදානගේ ජයන්ත අනුර ද සිල්වා, වික්‍රමරත්න මයා, අංක 2, 8 වැනි පටුමග, වාසල පාර, කොටහේන, කොළඹ 13 | බෝධි හැන්නදිගේ චන්ද්‍රිකා මිය, අංක 21, සේදවත්ත, වැල්ලම්පිටිය |
| (02) 43012 | මුරුගන් තවමනි මිය, අංක 151/22, ජින්තුපිටිය වීදිය, කොළඹ 13. | කරුපයියා මහේෂ්වරී මිය, අංක 99/34, ජින්තුපිටිය වීදිය, කොළඹ 13. |
| (03) 43328 | සියඹලා පිටියගේ තුෂාරි ප්‍රියදර්ශනී පෙරේරා මිය, අංක 08, රණකොට පාර, දකුණු තල්පිටිය, වාද්දුව | බොලොඤ්ඤගේ උදානි වසන්තා බොලොඤ්ඤ මිය, අංක 110ඩී, මැල්වත්ත පාර, කළුදැවල, පානදුර. |
| (04) 43240 | ශාලිකා හෙට්ටි හේවා මිය, අංක 105/1, කැරැව, කරන්දෙනිය. | හේවා දේවගේ දිනේෂ් ප්‍රියංක වීරසිංහ මයා, පාසැල අසල, උතුරු මාගල, ඌරගස්මං හන්දිය, කරන්දෙනිය. |
| (05) 43263 | වීරසිංහගේ දෝන රුවනි අනුපමා මිය, අංක 518/7, මෙත්සිරි පෙදෙස, පරණ පාර, කොට්ටාව, පන්නිපිටිය. | කලුමුල්ල වඩුගේ අජිත් ප්‍රියන්ත මයා, අංක 117/9, සිකුරාදා පොල, පැලැන්වත්ත, පන්නිපිටිය. |
| (06) 43274 | හෙට්ටිආරච්චිලාගේ ලසන්ත චාරුක හෙට්ටිආරච්චි මයා, ජයම්වත්ත, හුම්බුළුව, අලව්ව. | ජයසිංහ මුදියන්සේලාගේ සුමනාවතී මිය, ජයම්වත්ත, හුම්බුළුව, අලව්ව. |

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (07) 43273 | මුදියන්සේ රාළලාගේ ධර්මසේන නිලන්ත කුමාර මයා, අංක 494/ඒ, නැඳුන්ගමුව පාර, වැලිවේරිය. | සිලෝන් ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් කොම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්, අංක 129/1/2 ඩී. එස්. සේනානායක වීදිය, මහනුවර. |
| (08) 43268 | මලල ආලෝක බණ්ඩාරලාගේ ජයන්ත කුමාර බණ්ඩාර මයා, අංක 22, වාසිවැව, බලල්ල | කුරුකුලසූරියගේ කරුණාසේන මයා, අංක 627, ඇලවක, නිකවැරටිය. |
| (09) 43271 | මන්ඩඩිගේ රමින්ද කුමුදු ප්‍රනාන්දු මයා, අංක 28/24, සුධර්මාරත්නාරාම පාර, ඉදිබැද්ද, මොරටුව. | බැමිණිහැන්නදිගේ හේමමාලා දමයන්ති මිය, අංක 3/9ඒ, සුධර්මාරත්නාරාම පාර, සුගුණධජ මාවත, ඉදිබැද්ද, මොරටුව. |
| (10) 43159 | 1. පොහොරඹලාගේ පුංචි නෝනා මිය, අංක ඒ12, වැකඩ, අම්පාගල.<br>2. අතුකෝරාලලාගේ ඉන්දික චන්ද්‍රසේකර මයා අංක ඒ12, වැකඩ, අම්පාගල. | රන්හවඩිලාගේ අජිත් නිශාන්ත මයා, තෙල්කුමුදුවල, අම්පාගල. |

12-238

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/60/2014/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.12.05 වැනි දින සිට 2014.12.19 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2014.12.26 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

*උපලේඛනය*

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, ඒ දරන කොට්ඨාසයේ | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ, අලුත්කුරු කෝරළයේ, හොරම්පැල්ල පිහිටි අංක 53719 දරන පිඹුරේ සඳහන් ඉඩමෙන් බෙදා වෙන්කළ කොටසට මායිම්, | 01. ඩී. ඒ. එස්. විජයසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1963.03.18 දින ලියා සහතික කරන ලද අංක 10428 දරන විකුණුම් ඔප්පුව |

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| | උතුර : මෙම ඉඩමේ කොටසක්,<br>නැගෙනහිර : කුරුණෑගලට යන මහ පාර,<br>දකුණ : පොඩ්ඩප්පුහාමිට අයිති ඉඩමේ පැලඉනි වැට,<br>බටහිර : කර්තේලිස් අප්පුහාමිට අයිති ඉඩම<br>ප්‍රමාණය : අ. 01, රූ. 00, පර්. 00 | |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක : 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

12-131

---

**2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත**

ජාතික ව්‍යසන පාත්‍ර ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම

2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතේ II කොටස් 9 වන වගන්තියේ විධිවිධාන පරිදි බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ජාතික ව්‍යසන පාත්‍ර ප්‍රදේශයක් ලෙස 2014.10.29 දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

2014 නොවැම්බර් මස 20 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

12-240

---

**කර්මාන්ත ආඥාපනත**

දැන්වීම

1961 අංක 54 දරන කර්මාන්තශාලා (සංශෝධන) පනතින් 1976 අංක 12 දරන කර්මාන්තශාලා (සංශෝධන) පනතින් 1998 අංක 18 දරන කර්මාන්තශාලා (සංශෝධන) පනතින් 2000 අංක 33 දරන කර්මාන්තශාලා (සංශෝධකන) පනතින් හා 2002 අංක 19 දරන කර්මාන්තශාලා (සංශෝධන) පනතින් සංශෝධිත 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතින් දැක්වෙන කර්මාන්තශාලාවන්හි පදිංචිකරුවන් සහ මහජනතාවගේ දැන ගැනීම සඳහා පහත දැක්වෙන කාර්යාල දැනට ක්‍රියාත්මකව පවතින බව දන්වනු ලැබේ.

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ III වන තීරයේ සඳහන් මැතිවරණ සහ පරිපාලන දිස්ත්‍රික්කවල පිහිටි කර්මාන්තශාලාවන්හි පදිංචිකරුවන් විසින් ඉහත කී ආඥාපනත හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසි අනුව කලින් කලට ඉදිරිපත් කළ යුතු සියළුම ලේඛන, වාර්තා නිවේදන සහ වෙනත් ලියවිලි ඉදිරිපත් කිරීමේ දී මින් ඉදිරියට මෙහි II වන තීරුවෙහි සඳහන් දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැනගේ කාර්යාලීය ලිපිනයට යැවිය යුතු වන්නේ ය.

සේවයෙ යොදවනු ලැබූ තැනැත්තන් කර්මාන්ත ශාලාවලට ඇතුළුවන ප්‍රධාන දොරටුවල මෙම ලිපිනයන් ප්‍රදර්ශනය කිරීම, කර්මාන්තශාලා ආඥාපනතෙහි 90(1)(ආ) වගන්තිය පරිදි කළ යුතු බැවින් එයට මෙයින් අවධානය යොමු කරවමි.

මෙම දැන්වීමෙන් 2008 අගෝස්තු 22 අංක 1564 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම සංශෝධනය වේ.

ඩබ්ලිව්. එල්. එස්. විජේසුන්දර,
කම්කරු කොමසාරිස් (කර්මාන්තමය සුරක්ෂිතතා)
හා ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු.

කර්මාන්තමය සුරක්ෂිතතා අංශය,
කම්කරු දෙපාර්තමේන්තුව,
අංක 97, ජාවත්ත පාර,
කොළඹ 05.

**උපලේඛනය**

| *තීරුව I* *තනතුර* | *තීරුව II* *ලිපිනය හා දුරකථන අංකය* | *තීරුව III* *භාරව කටයුතු කරන පරිපාලන දිස්ත්‍රික්කය* |
|---|---|---|
| ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු | ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය,<br>කර්මාන්තමය සුරක්ෂිතතා අංශය,<br>කම්කරු දෙපාර්තමේන්තුව,<br>අංක 97, ජාවත්ත පාර,<br>කොළඹ 05<br>දුරකථන අංකය 011-2508783<br>ෆැක්ස් අංකය 011-2508783 | සියළුම පරිපාලන දිස්ත්‍රික්ක |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කොළඹ | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය,<br>කම්කරු දෙපාර්තමේන්තුව,<br>අංක 97, ජාවත්ත පාර,<br>කොළඹ 05<br>දුරකථන අංකය 011-2508775<br>ෆැක්ස් අංකය 011-2508774 | කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු ගම්පහ | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය,<br>කම්කරු දෙපාර්තමේන්තුව,<br>අංක 207, ශ්‍රී බෝධි පාර,<br>ගම්පහ<br>දුරකථන අංකය 033-2232409<br>ෆැක්ස් අංකය 033-2232403 | ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කළුතර | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය,<br>කම්කරු දෙපාර්තමේන්තුව,<br>අංක 1/131, පරණ පාර,<br>කළුතර දකුණ<br>දුරකථන අංකය 034-2221752<br>ෆැක්ස් අංකය 034-2221752 | කළුතර දිස්ත්‍රික්කය |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කුරුණෑගල | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය,<br>අංක 143/බී, දකුණු රවුම් පාර,<br>ගැට්ටුවාන,<br>කුරුණෑගල<br>දුරකථන අංකය 037-2220760<br>ෆැක්ස් අංකය 037-2220760 | කුරුණෑගල හා පුත්තලම පරිපාලන දිස්ත්‍රික්ක |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු මහනුවර | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය,<br>කම්කරු මහ ලේකම් කාර්යාලය,<br>අංක 111/2, යටිනුවර වීදිය,<br>මහනුවර.<br>දුරකථන අංකය 081-2225087<br>ෆැක්ස් අංකය 081-2225087 | මහනුවර, මාතලේ හා නුවර එළිය පරිපාලන දිස්ත්‍රික්ක |

| *තීරුව I* *තනතුර* | *තීරුව II* *ලිපිනය හා දුරකථන අංකය* | *තීරුව III* *භාරව කටයුතු කරන පරිපාලන දිස්ත්‍රික්කය* |
|---|---|---|
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු ගාල්ල. | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය, කම්කරු දෙපාර්තමේන්තුව, පහල ඩික්සන් පාර, ගාල්ල. දුරකථන අංකය 091-2225778 ෆැක්ස් අංකය 091-2225778 | ගාල්ල, මාතර හා හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්ක |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු යාපනය. | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය, කම්කරු දෙපාර්තමේන්තුව, අක 133, නාවලර් පාර, යාපනය. දුරකථන අංකය 021-2224052 ෆැක්ස් අංකය 021-2224052 | යාපනය, මුලතිව්, මන්නාරම, වවුනියාව හා කිලිනොච්චිය පරිපාලන දිස්ත්‍රික්ක |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු අනුරාධපුරය | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය, කම්කරු දෙපාර්තමේන්තුව, උසාවිය පෙදෙස, අනුරාධපුරය දුරකථන අංකය 025-2226798 ෆැක්ස් අංකය 025-2226798 | අනුරාධපුරය, පොලොන්නරුව, ත්‍රිකුණාමලය හා මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්ක |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු රත්නපුරය | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය, කම්කරු දෙපාර්තමේන්තුව, ධර්මපාල මාවත, රත්නපුර දුරකථන අංකය 045-2232069 ෆැක්ස් අංකය 045-2232069 | රත්නපුර හා කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්ක |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු බදුල්ල | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය, කම්කරු දෙපාර්තමේන්තුව, අංක 96ඒ, මහියංගන පාර, බදුල්ල. දුරකථන අංකය 055-2223550 ෆැක්ස් අංකය 055-2223550 | බදුල්ල, මොණරාගල, හා අම්පාර පරිපාලන දිස්ත්‍රික්ක |

12-180

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**ඩීඑෆ්සීසී වර්ධන බැංක් පීඑල්සී බැංකුව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැංක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැංක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 සැප්තැම්බර් මස 26 දින දී එක්ච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී වර්ධන බැංක් පීඑල්සී බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් ලියා සහතික කළ අංක 26274 හා 2008 නොවැම්බර් 19 දින දරන උකස් බැඳුම්කරය මත, අයවිය යුතු මුදල් ගෙවීම්, කැළණිය, ගෝනවල, පුංචිහේවගේ මනෝජ් චමින්ද ජයලත් සහ පොත්තවෙල කංකානමගේ ප්‍රසන්ති නිමල්කා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2013 දෙසැම්බර් 31 වැනි දිනට ඉහත කී අංක 26274 දරන උකස් බැඳුම්කර මත එකී පුංචිහේවගේ මනෝජ් චමින්ද ජයලත් සහ පොත්තවෙල කංකානමගේ ප්‍රසන්ති නිමල්කා යන අයගෙන් ඩීඑෆ්සීසී වර්ධන බැංක් පීඑල්සී බැංකුවට රුපියල් හැත්තෑහත් ලක්ෂ දසදහස් හයසිය තිස්පහකුත් ශත හතළිහක (රු. 77,10,635.40) මුදලක් සහ 2014 ජනවාරි මස 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එකී රුපියල් හැත්තෑහත් ලක්ෂ දහදහස් හයසිය තිස්පහකුත් ශත හතළිහක (රු. 77,10,635.40) මුදල සඳහා වර්ෂයකට සියයට පහළොව (15%) බැගින් ගණනය කළ පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් හැත්තෑහත් ලක්ෂ දසදහස් හයසිය තිස්පහකුත් ශත හතළිහක (රු. 77,10,635.40) මුදලක් සහ 2014 ජනවාරි 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එකී රුපියල් හැත්තෑහත් ලක්ෂ දසදහස් හයසිය තිස්පහකුත් ශත හතළිහක (රු. 77,10,635.40) මුදල සඳහා වර්ෂයකට සියයට පහළොව (15%) බැගින් ගණනය කළ පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී අංක 26274 දරන උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 26274 දරන උකස් බැඳුම්කරය මගින් පොත්තවෙල කංකානමගේ ප්‍රසන්ති තිමල්කා යන අය විසින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ ගොඩනැගිලි හා එහි පිහිටි වෙනත් සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ශොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 26274 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මාබිම පිහිටි දෙල්ගහලන්දෙවත්ත නමැති ඉඩමේ බලයලත් මානක එඩ්වඩ්. ඊ. විජේසූරිය මැන සකස් කළ අංක 1610 හා 2008.10.30 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට වූ උතුරට : කිංග්ස්ලිට සහ තවත් අයට අයිති ඉඩම ද ; නැගෙනහිරට : ඉබ්‍රාහිම්ට අයිති ඉඩම සහ අඩි 12ක් පළල පාර ද ; දකුණට : අඩි 12ක් පළල පාර ද ; බස්නාහිරට : එම ඉඩමේම කොටසක් ද යන මායිම් ඇතුළත රූඩ් දෙකකුත් පර්චස් තිස්තුනකුත් දශම හයයි තුනක් (අ. 0. රූ. 2, පර්. 33.63) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

ඉහත කී ඉඩම පහත සඳහන් ඉඩම නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මාබිම පිහිටි "දෙල්ගහලන්දෙවත්ත " නමැති ඉඩමේ බලයලත් මානක එස්. රාමක්‍රිෂ්ණන් මැන සකස් කළ අංක 10975 හා 2003.11.07 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ උතුරට : කිංග්ස්ලිට සහ තවත් අයට අයිති ඉඩම ද, නැගෙනහිරට : ඉබ්‍රාහිම්ට අයිති ඉඩම සහ අඩි 12ක් පළල පාර ද, දකුණට : කුසුමාවතීට සහ තවත් අයට අයිති ඉඩම ද, බස්නාහිරට : එම ඉඩමේම කොටසක් ද යන මායිම් ඇතුළත රූඩ් තුනකුත් පර්චස් දෙකකුත් දශම පහක් (අ. 0, රූ. 3, පර්. 2.5) බිම් ප්‍රමාණයෙන් යුත් සහ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි ඉඩම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. ඉහත සඳහන් අංක 10975 දරන පිඹුරේ පෙන්නුම්කර තිබෙන පාර පාවිච්චි කිරීමේ අයිතිවාසිකම මෙයට ඇතුළත් වේ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී.
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

12-94

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලයේ විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 1198668 සහ 1219181.
එෂියන් ට්‍රේඩින් ඇන්ඩ් මාකටින් කම්පණි (ප්‍රයිවට්) ලිමිටඩ්.

2014 අගෝස්තු 29 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකඡන්දයෙන් මෙලෙස නිශ්චය කරනු ලබයි.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. එන්. ද සිල්වා විසින් 2003 ජූලි 10 වැනි දින සහතික කරන ලද අංක 2249 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් 2007 ඔක්තෝබර් 09 වැනි දින සහතික කරන ලද අංක 3638 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරය (මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පානදුර, කෙසෙල්වත්ත, පන්සල පාරේ, අංක 289/112 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකා තුළ නීත්‍යානුකූල සමාගමක් වශයෙන් ස්ථාපිත එෂියන් ට්‍රේඩින් ඇන්ඩ් මාකටින් කම්පණි (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ ජයන්ත දැඩිගම උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් 2003 සැප්තැම්බර් මස 22 වැනි දින සහතික කරන ලද අංක 2247 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එන්. පී. පෙරේරා විසින් 2007 ඔක්තෝබර් 9 වැනි දින සහතික කරන ලද අංක 989 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ ද බැඳුම්කරය (මෙහි දෙවන උපලේඛනයේ සවිස්තර විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පානදුර, කෙසෙල්වත්ත, පන්සල පාරේ, අංක 289/112 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාව තුළ නීත්‍යානුකූල සමාගමක් වශයෙන් ස්ථාපිත එෂියන් ට්‍රේඩින් ඇන්ඩ් මාකටින් කම්පණි (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ ජයන්ත දැඩිගම උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

එකී බැඳුම්කර යටතේ රුපියල් එක්කෝටි අසූලක්ෂය (රු. 18,000,000) ක මුදලක් 2013 අප්‍රේල් 01 වැනි දින වන විට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් එක්කෝටි අසූලක්ෂය (රු. 18,000,000) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 අප්‍රේල් 02 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 18,000,000ක මුදල මත 15% ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද, අඩුකොට එකී අංක 2249, 3638, 2247 සහ 989 දරන බැඳුම්කරයන් යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තාවූ ද, මෙහි පළවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ඩොෆ් වීදියේ අංක 182 හි 3 වන මහලේ ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි ආනුශාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභාවේ කෙසෙල්වත්ත උප කාර්යාල සීමාව තුළ කෙසෙල්වත්තේ පිහිටි ගොඩපරගහලන්ද නොහොත් දෙල්ගහවත්ත සහ දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. පී. කුමාරගේ විසින් 2001 ජනවාරි 05 වැනි දින සාදන ලද අංක 1185 දරන පිඹුරේ ලොට් A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : පන්සල පාර ද, නැගෙනහිරට : ඩබ්. ජයන්ත අල්විස් හිමිකම් කියන ඉඩමේ වරිපනම් අංක 289/88 දරන පරිශ්‍රය සහ අඩි 15ක් පළල පාර ද, දකුණට : එස්. පී. මල්ලිකාරත්න හිමිකම් කියන ඉඩමේ (වරිපනම් අංක 289/88) සහ ජයන්ත අල්විස් හිමිකම් කියන ඉඩමේ (වරිපනම් අංක 289/110B) ද සහ බස්නාහිරට : ඩබ්. ඩබ්. කේ. පී. ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩමේ (වරිපනම් අංක 289/114), ඒ. ඩබ්. නන්දසිරි හිමිකම් කියන ඉඩමේ (වරිපනම් අංක 289/116) සහ වරිපනම් අංක 289/118 ද මායිම් වූ එකී අංක 1185 දරන පිඹුර ප්‍රකාරව, පර්චස් විසිනමයයි දශම අටයි එක (අ. 0, රූ. 0, පර්. 29.81) ක විශාලත්වයෙන් යුත් ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව F397/277 යටතේ ලියාපදිංචි වී ඇත.

### දෙවන උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්ද සීමාව තුළ කෙසෙල්වත්තේ පිහිටි පුහුහෙරලියගහවත්ත (බලයලත් මිනින්දෝරු එච්. ඩබ්. ප්‍රනාන්දු විසින් 1979 ඔක්තෝබර් 22 වැනි දින මැන බෙදා වෙන් කරන ලද අංක 3726 දරන පිඹුරේ ලොට් 1H) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ලියනගේ විසින් 1990 දෙසැම්බර් 09 වැනි දින සාදන ලද අංක 1098 දරන පිඹුරේ ලෙට් 1Ha වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් ද, උතුරට : අංක 3726 දරන පිඹුරේ ලොට් 1E සහ 1F ද, නැගෙනහිරට : මෙහි ලොට් 1Hb සහ 1Hc ද, දකුණට : ගල්වලහෙල නොහොත් කුඹුර සහ ඇල ද සහ බස්නාහිරට : ගල්වලහෙල නොහොත් කුඹුර සහ ඇලෙන් ද මායිම් වූ පර්චස් තිහ (අ. 0, රූ. 0, පර්. 30) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි ගහකොළ සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව F333/369 යටතේ ලියාපදිංචි වී ඇත.

2. ඉහත සඳහන් කෙසෙල්වත්තේ පිහිටි පුහුහෙරලියගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ලියනගේ විසින් 1990 දෙසැම්බර් මස 09 වැනි දින සාදන ලද අංක 1098 දරන පිඹුරේ ලොට් 1Hb වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : අංක 3726 දරන පිඹුරේ ලොට් 1F සහ එම ඉඩමේම ලොට් 2 ද, නැගෙනහිරට : අංක 3726 දරන පිඹුරේ ලොට් 1C සහ එම ඉඩමේම ලොට් 2 ද, දකුණට : එම ඉඩමේම ලොට් 2 සහ ලොට් 1Hc ද සහ බස්නාහිරට : ලොට් 1Ha වලින් ද මායිම් වූ පර්චස් දාහතයි දශම නමයයි හතර (අ. 0, රූ. 0, පර්. 17.94) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි ගහකොළ සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව F333/370 යටතේ ලියාපදිංචි වී ඇත.

පහත සඳහන් මාර්ග වෙන් කිරීම මතින් ඇති නිදහස් පරිහරණ අයිතිය සමග වේ.

ඉහත සඳහන් කෙසෙල්වත්තේ පිහිටි පුහුහෙරලියගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ලියනගේ විසින් 1990 දෙසැම්බර් මස 09 වැනි දින සාදන ලද අංක 1098 දරන පිඹුරේ ලොට් 1Hc (අඩි 10ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : මෙහි ලොට් 1Hb ද, නැගෙනහිරට : දිග්ගල පාරෙන් ද, දකුණට : ගල්වලහෙල නොහොත් කුඹුර සහ ඇලෙන් ද සහ බස්නාහිරට : ලෙට් 1Ha වලින් ද මායිම් වූ පර්චස් දෙකයි දශම හතරයි හය (අ. 0, රූ. 0, පර්. 2.46)ක විශාලත්වයෙන් වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව F333/244 යටතේ ලියාපදිංචි වී ඇත.

රන්ජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

12-138

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 1649635
පින්නවල වත්තගේ දොන් අයේෂ් ශ්‍යාමල් කුමාර.

2014 සැප්තැම්බර් 26 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකඡන්දයෙන් මෙලෙස නිශ්චය කරනු ලබයි.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් වී. පී. ඩයස් විසින් 2003 නොවැම්බර් 05 වැනි දින සහතික කරන ලද අංක 2417 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පින්නල වත්තගේ දොන් අයේෂ් ශ්‍යාමල් කුමාර ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙකෝටි විසිදෙලක්ෂ පනස්දෙදහස් තුන්සිය දහනමයයි ශත නමයක (රු. 22,252,319.09) මුදලක් 2014 ජූලි 17 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දෙකෝටි විසිදෙලක්ෂ පනස්දෙදහස් තුන්සිය දහනමයයි ශත නමයක (රු. 22,252,319.09) මුදල අයකර ගැනීම සඳහා සහ 2014 ජූලි 18 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 20,705,486ක මුදල මත 24%ක වැඩිදුර පොළියක් සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 2417 බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තාවූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපල සහ පරිශ්‍ර කොළඹ 12, හල්ස්ඩ්‍රොෆ් වීදියේ අංක 182 දරන ස්ථානයේ 3 වන මහලේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල් බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, 61A, ආඬිමුල්ල ග්‍රාම නිලධාරී වසමේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ අළුත්කුරු කෝරළේ, දූන්ගහපත්තුවේ ආඬිමුල්ල ග්‍රාමයේ පිහිටි "මිල්ලගහකුඹුර " නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටම්බගේ විසින් 2004 ජනවාරි 06 වැනි දින සාදන ලද අංක 6772 දරන පිඹුරේ දැක්වෙන ඉඩම් කොටසට මායිම්

වශයෙන් උතුරට : කොච්චිකඩේ සිට මඩම්පැල්ල (R. D. A. පාරෙන් ද), නැගෙනහිරට : එස්. එම්. ඒ. චන්ද්‍රලතා සහ ඇලෙක්සිකා සේරසිංහ හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : පාරෙන් ද සහ බස්නාහිරට : පාරෙන් ද මායිම් වූ එකී අංක 6772 දරන පිඹුරු ප්‍රකාරව රූඩ් දෙකයි පර්චස් පහළොවයි දශම බිංදුව (අ. 0, රූ. 2, පර්. 15.0) ක හෙවත් හෙක්ටයාර් 0.03794 විශාලත්වයෙන් වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව E946/280 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්යේ, 61A, ආඬිමුල්ල ග්‍රාම නිලධාරී වසමේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ අළුත්කුරු කෝරලේ, දූන්ගහපත්තුවේ ආඬිමුල්ල ග්‍රාමයේ පිහිටි "මිල්ලගහවත්ත " නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටම්බගේ විසින් 2010 දෙසැම්බර් මස 31 වැනි දින සාදන ලද අංක 1730A දරන පිඹුරේ දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : කොච්චිකඩේ සිට මඩම්පැල්ල (R. D. A. පාරෙන් ද) නැගෙනහිරට : ඇන් සඳමාලි හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : ඇන් සඳමාලි හිමිකම් කියන ඉඩමෙන් ද සහ බස්නාහිරට : එස්. එම්. ඒ. චන්ද්‍රලතා හිමිකම් කියන ඉඩමෙන් ද මායිම් වූ එකී අංක 6772 දරන පිඹුරු ප්‍රකාරව පර්චස් විසිපහ (අ. 0, රූ. 0, පර්. 25) හෙවත් හෙක්ටයාර් 0.06323 විශාලත්වයෙන් වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව E922/283 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

12-137

---

## සෙලාන් බැංකුව පීඑල්සී - සංස්ථා බැංකු ව්‍යාපාර ඒකකය (2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

ගිණුම් අංකය : 0864-3344682-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ඔක්තෝබර් මස 30 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත.) ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. ආර්. පී. කුමාරි විසින් දෙකම සහතික කරන ලද 2013 අප්‍රේල් 2 දිනැති අංක 1589 සහ 1590 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම්, ජාඇල සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ ලියාපදිංචි අංක 5569 දරන (කලින් එන් (පීවීඑස්) 32678) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් වන හොලිවුඩ් පැෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් සහ ජාඇල පදිංචි බාලසූරිය අප්පුහාමිලාගේ මේරි ප්‍රසිටා පෙරේරා සහ ජාඇල පදිංචි මහපටබැඳිගේ ලක්ෂ්මන් ජෙරාඩ් පෙරේරා යන අය උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දසකෝටි හැත්තෑපන් ලක්ෂ පන්දහස් අටසිය තිහයි ශත අසූනවයක (රු. 107,505,830.89) මුදලක්, 2014 අප්‍රේල් 10 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 107,505,830.89 මුදල ද, 2014 අප්‍රේල් 11 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුලට වර්ෂයකට සියයට විසි හතර (24%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1589 සහ 1590 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි සඳහන් පළමුවැනි සහ දෙවැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සහ ලියා පදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ ජාඇල නගර සභා සීමාව තුළ කණුවන පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් සාදන ලද 2004.07.14 දිනැති අංක 2860ඒ දරන සැලැස්මේ නිරූපනය වන වරිපනම් අංක 80 දරන මකුල්ලගහවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් එක්ස් ලකුණු කළ බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම් උතුරට : ඇලෙක්සැන්ඩර් පෙරේරාගේ ඉඩම ද, නැගෙනහිරට : අංක 2857 දරන සැලැස්මේ සඳහන් ලොට් 5සී සහ කේ. කේ. සර්වායිගේ ඉඩම ද, දකුණට : බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ්ගේ අංක 461 සැලැස්මේ සඳහන් ලොට් 2 සහ බස්නාහිරට : පාර (මහා මාර්ගය) ද යන මායිම් තුළ පර්චස් දහහතයි දශම අටයි එකක් (අ. 0, රූ. 0, පර්. 17.81) විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ජේ 42/66 හි ලියාපදිංචි කර ඇත.

### දෙවෙනි උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ ජාඇල නගර සභා සීමාව තුළ වැලිගම්පිටිය, ඉදිව්ටිය පාර පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් සාදන ලද 2004.11.12 දිනැති අංක 3433 දරන සැලැස්මේ නිරූපනය වන වරිපනම් අංක 1 දරන කෝන්ගහවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමට මායිම්, උතුරට : ඉදිව්ටිය පාර ද, නැගෙනහිරට : එන්. ඩබ්ලිව්. පී. ඒ. පෙරේරාගේ ඉඩම ද, දකුණට : එෆ්. රැද්‍රිගු ගේ උරුමක්කරුවන්ගේ ඉඩම සහ බස්නාහිරට : එෆ්. රැද්‍රිගු ගේ උරුමක්කරුවන්ගේ ඉඩම ද යන මායිම් තුළ පර්චස් විස්සයි දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 20.35) විශාල ඉඩම මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ජේ 42/67 හි ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කරන ලද ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමක් වේ.

පෙර කී වැලිගම්පිටිය පිහිටි බලයලත් මිනින්දෝරු එච්. සී. පී. ඩයස් විසින් සාදන ලද 1964.04.03 දිනැති අංක 543 දරන සැලැස්මේ නිරූපනය වන කෝන්ගහවත්ත නමැති බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම් උතුරට : ඉදිව්ටිය පාර ද, නැගෙනහිරට : එන්. ඩබ්ලිව්. පී. ඇන්තනි පෙරේරා මහතාට සහ මහත්මියට හිමි දේපළ ද, දකුණට : ෆ්‍රැන්සිස් රැද්‍රිගු ට හිමි දේපළ සහ බස්නාහිරට : ෆ්‍රැන්සිස් රැද්‍රිගුට හිමි දේපළ ද යන මායිම් තුළ පර්චස් විස්සයි දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 20.35) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව එච් 69/39හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
සහකාර සාමාන්‍යාධිකාරිණී - නීති.

12-152

---

**සෙලාන් බැංකුව පීඑල්සී - මාවතගම ශාඛාව (2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

ගිණුම් අංකය : 1090-34318202-001 සහ 0180-01326011-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 ඔක්තෝබර් මස 30 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත.) ප්‍රසිද්ධ නොතාරිස් ඊ. එම්. එස්. ද සේරම් විසින් සහතික කරන ලද 2014 අප්‍රේල් 30 දිනැති අංක 2538 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම්, මාවතගම පදිංචි ලොකු ගුරුන්නැහෙලැ ගෙදර මොහමඩ් ෂෙරීෆ් මොහමඩ් හිදයතුල්ලා යන අය බන්ධනාදයී වශයෙන් රුපියල් එක්කෝටි හතලිස් නව ලක්ෂ හැත්තෑතුන් දහස් එකසිය හැත්තෑ හතරයි ශත පනස් හතරක (රු. 14,973,174.54) මුදලක්, 2014 සැප්තැම්බර් 2 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 14,973,174.54 මුදල ද, 2014 සැප්තැම්බර් 03 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට (17%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 2538 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර චන්ද්‍රිමා ප්‍රියදර්ශනී ගමගේ මෙනෙවිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම මහනගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම්ගේ කාර්යාලය තුළ ගංගොඩවිල ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ ගංගොඩවිල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද 2008.01.24 දිනැති අංක 4/08 සැලැස්මේ නිරූපනය වන බක්මීගහවත්ත (දැන්) සහ කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 02 ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට්ස් 01 සහ 04 ද, නැගෙනහිරට : ලොට් 3 සහ වරිපනම් අංක 94/2 පරිශ්‍රය සහ පැපිලියාන පාර ද, දකුණට : පැපිලියාන පාර වරිපනම් අංක 94/2 පරිශ්‍රය සහ බස්නාහිරට : අඹගහකුඹුර ද (යන පාර) ද යන මායිම් තුළ පර්චස් දහසයයි දශම බිංදුවයි එකක් (අ. 0, රූ. 0, පර්. 16.01) ක් විශාල ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි සියලු දේත් සහ එයට අයත් සියලු දේ සමග සහ බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. විරසිංහ විසින් සාදන ලද 1993.08.31 දිනැති අංක 407 දරන සැලැස්මේ සඳහන් ලොට්ස් 1 සහ 2 ලකුණු කළ හැරවුම් කවසියල්ලම පාවිච්චි කිරීමේ සහ නඩත්තු කිරීමේ අයිතිය සහ ඉහත සඳහන් අංක 4/08 දරන සැලැස්මේ ලොට් 4 මාර්ග අයිතියක් වශයෙන් පොදුවේ පාවිච්චි කිරීම සමග ඉඩම. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඒ 92/73 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම මහ නගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ගංගොඩවිල ග්‍රාම නිලධාරී වසම තුළ ගංගොඩවිල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද 2014.03.31 දිනැති අංක 10/14 සැලැස්මේ නිරූපනය වන බක්මීගහ ඕවිට නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද අංක 4/08 සැලැස්මේ ලොට් 4හි කොටසක්) බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 15 ඒ/65 සැලැස්මේ ලොට් 2, පැපිලියාන පාර සහ වරිපනම් අංක 94/15 ද, නැගෙනහිරට : අංක 4/08 දරන සැලැස්මේ ලොට්ස් 4 සහ 3 ද, දකුණට : ලොට් 2 සහ බස්නාහිරට : අංක 4/08 සැලැස්මේ ලොට් 1 ද යන මායිම් තුළ පර්චස් එකයි දශම හතයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 1.72)ක් විශාල ඉඩම. පෙර ලියාපදිංචිය නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 190/103.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම මහ නගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ගංගොඩවිල ග්‍රාම නිලධාරී වසම තුළ ගංගොඩවිල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද 2014.03.31 දිනැති අංක 10/14 සැලැස්මේ නිරූපනය වන බක්මීගහ ඕවිට නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද අංක 4/08 සැලැස්මේ ලොට් 4හි කොටසක්) බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 01 ද. නැගෙනහිරට : අංක 4/08 දරන සැලැස්මේ ලොට් 3 ද, දකුණට : ලොට් 3 සහ බස්නාහිරට : අංක 4/08 සැලැස්මේ ලොට් 1 ද යන මායිම් තුළ පර්චස් එකයි දශම හතයි අටක් (අ. 0, රූ. 0, පර්. 1.78)ක් විශාල ඉඩම. පෙර ලියාපදිංචිය නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 190/104.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම මහ නගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ගංගොඩවිල ග්‍රාම නිලධාරී වසම තුළ ගංගොඩවිල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද 2014.03.31 දිනැති අංක 10/14 සැලැස්මේ නිරූපනය වන බක්මීගහ ඕවිට නමැති ඉඩමේ ලොට් 3 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එස්. එල්. පී. සතරසිංහ විසින් සාදන ලද අංක 4/08 සැලැස්මේ ලොට් 4හි කොටසක්) බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 02 ද. නැගෙනහිරට : අංක 4/08 දරන සැලැස්මේ ලොට් 3 ද, දකුණට : අංක 4/08 සැලැස්මේ ලොට් 2හි ඉතිරි කොටස සහ බස්නාහිරට : අංක 4/08 සැලැස්මේ ලොට් 1 ද යන මායිම් තුළ පර්චස් දශම දෙකයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 0.22)ක් විශාල ඉඩම. පෙර ලියාපදිංචිය නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 190/105.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
සහකාර සාමාන්‍යාධිකාරිණී - නීති.

12-151

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැලකිය යුතුයි.*** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| දෙසැම්බර් | 2014.12.05 | සිකුරාදා | 2014.11.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.12 | සිකුරාදා | 2014.11.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.19 | සිකුරාදා | 2014.12.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.26 | සිකුරාදා | 2014.12.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2015** | | | |
| ජනවාරි | 2015.01.02 | සිකුරාදා | 2014.12.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.09 | සිකුරාදා | 2014.12.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.16 | සිකුරාදා | 2015.01.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.23 | සිකුරාදා | 2015.01.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.30 | සිකුරාදා | 2015.01.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2015.02.06 | සිකුරාදා | 2015.01.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.02.13 | සිකුරාදා | 2015.01.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.02.20 | සිකුරාදා | 2015.02.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.02.27 | සිකුරාදා | 2015.02.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.